යටිනුවර ප්‍රාදේශීය සභාව.

මහනුවර දිස්ත්‍රික්කය.

-------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 17 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට යටිනුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම.**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.**

පහත සදහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ප්‍රාදේශීය සභාව සතු කැබ් රථයක් හා ට්‍රැක්ටර් ටේලර් 02 ක එකතු වටිනාකම වූ රු.345,000 ක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) කර්මාන්ත 2 ක් සඳහා ගෙවිය යුතු රු.501,663 ක මුදල රු.320,163 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් රු.181,500 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාළ එහෙත්, 2017 වර්ෂයේ දි අවස්ථා 15 කදී ගෙවන ලද රු.299,973 ක වියදම්, සමාලෝචිත වර්ෂයේ ණයහිමියන් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන දායක විශ්‍රාම වැටුප් අරමුදලට රු.136,070 ක මුදලක් ගෙවිය යුතුව ඇතත්, රු.27,331 ක් ලෙස ණයහිමියන් යටතේ ගිණුම්ගත කිරිම හේතුවෙන් විවිධ ණයහිමි ශේෂය රු.108,739 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඉ) පූර්ව වර්ෂවල දී පුස්තකාල පොත් මිල දී ගැනීමේ දී ලැබී තිබූ වට්ටම් අඩු කර පුස්තකාල පොත් ප්‍රාග්ධනිත කිරීමේ වරද නිවැරදි කිරීමේ දී අදාළ වට්ටම් රු.394,659 ක මුදල ස්ථාවර

**වත්කම්වලට ගලපා ඇතත්, ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමට ගලපා නොතිබීම නිසා රු.394,659 ක් අඩුවෙන් ගිණුම්ගත වී තිබුණි.**

**1.3.2 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්.**
**---------------------------------**

**(අ) ලැබියයුතු ගිණුම්.**
**--------------------**

**2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ අයිතම 8 ක එකතු වටිනාකම රු.70,905,960 ක් වූ අතර, එයින් අවුරුදු 5 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.1,329,351 ක් හා අවුරුදු 1 ත් 5 ත් අතර කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂවල එකතුව රු.17,446,995 ක් වී තිබුණි.**

**(ආ) ගෙවියයුතු ගිණුම්.**
**---------------------**

**සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පැවති ණයහිමි ශේෂ 2 ක එකතු වටිනාකම රු.46,871,514 ක් වූ අතර, එයින් අවුරුදු 1 ත් 5 ත් අතර කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.15,699,124 ක් වී තිබුණි.**

**1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.**
**---------------------------------**

**(අ) ගිණුම් විෂයයන් 13 කට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන්, එකතුව රු.211,639,281 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.**

**(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මෝටර් රථ හා කරත්ත යටතේ ගිණුම්ගත කර තිබූ රු.8,570 ක් වටිනා පාපැදි 13 ක් හා රු.103,700 ක් වටිනා කසළ කරත්ත 19 ක් භෞතික පරීක්ෂාව සඳහා ඉදිරිපත් නොකෙරුණි.**

**1.3.4 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.**

**පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.**

| | | නීති, රීති හා රෙගුලාසී යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | | 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනත (1996 අගෝස්තු 06 දිනැති අංක 935/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් සංශෝධිත පරිදි) | |
| | | 22 (i) (ආ) හා (ඇ) ඡේද | අනු බෙදුම් කරන ලද වලව්වේවත්ත ඇන්ඩ් පාර්ට් ඔෆ් දවකේකුඹුර නමැති ඉඩමේ, අතුරු බෙදීම පර්චස් 40 ට අඩු හා සභාවට වෙන් කරන ලද කොටස පර්චස් 65.6 ක් වී තිබිය දී, පර්චස් 29.9 ක් සඳහා පර්චස් 1 ක් රු.48,906 ක් බැගින් රු.1,462,281 ක් වූ මුදල් අදාළ සංවර්ධනකරුගෙන් ලබා ගෙන පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. |
| (ආ) | | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| | i | 217 රීතිය | පී.එස්. 46 ආකෘතිය අනුව, ඉඩම් හා ගොඩනැගිලි ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| | ii | 218 රීතිය | සභාව සතු සියලු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ වාර්ෂික සමීක්ෂණයක් කර නොතිබුණු අතර, එම ඉඩම් හා ගොඩනැගිලිවලට අදාළ වැට මායිම් සකස් කර ඉඩම් සුරක්ෂිත කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>------------------------------------------- | |
| | මු.රෙ.102, 103 හා 104 | 2003 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුළ වාහන අනතුරු හා අස්ථානගතවීම් අවස්ථා 5 ක් සම්බන්ධව, සභාවට සිදු වූ හානි පාඩු ලේඛනගත කර නොතිබුණි. හානි පාඩු 3 කට අදාළව එම හානි පාඩු සම්බන්ධව විධිමත් පරික්ෂණ සිදු කර අලාභ අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | චක්‍රලේඛ<br>----------- | |
| i | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය. | සභාව සතු වාහන 17 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |
| ii | 1994 අගෝස්තු 03 දිනැති අංක 26/92(1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය 02 ඡේදය. | සභාව සතු වාහන 18 ක රාජ්‍ය ලාංඡනය යොදා නොතිබුණි. |
| iii | 2015 ජුලි 10 දිනැති අංක 02/2015 (02) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය. | සභාව සතු අපහරණය කළ යුතු වාහන 7 ක් සහ ට්‍රැක්ටර් ටේලර් 4 ක් වර්ෂ 5 ත් 23 ත් අතර කාලයක සිට විනාශ වීමට ඉඩ හැර තිබුණි. |

**2.** මූල්‍ය සමාලෝචනය.
----------------------

**2.1** මූල්‍ය ප්‍රතිඵල.
-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.40,113,445 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.39,295,516 ක් වූයෙන්, මූල්‍ය ප්‍රතිඵලවල රු.817,929 ක වර්ධනයක් දක්නට ලැබුණි.

**2.2** ආදායම් පරිපාලනය.
-----------------------

**2.2.1** වරිපනම්.
----------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි **01** දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.**3,776,011** ක් වූ අතර, ඉන් වර්ෂය තුළ දී රු.**1,185,171** ක් අය කර ගෙන තිබුණි. වර්ෂයේ බිල් කළ ආදායම රු.**3,468,400** ක් වූ අතර, ඉන් රු.**2,585,575** ක් අය කර ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී හිඟයෙන් හා බිල් කිරීම්වලින් අය කර ගැනීම් ප්‍රතිශතය පිළිවෙලින් සියයට **31** ත් සියයට **60** ත් වූ අතර, දෙසැම්බර් **31** දිනට හිඟ ශේෂය රු.**3,473,665** ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් **31** දිනට රජයේ ආයතන **5** කින් වර්ෂ **4** ත් **8** ත් අතර කාලයක සිට හිඟව පැවත එන රු.**783,834** ක ශේෂයක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2** අක්කර බදු.
---------------

**2016** දෙසැම්බර් **31** දින වන විට රු.**59,870** ක හිඟ අක්කර බදු මුදලක් පැවති අතර, එහි වර්ෂ **18** ත් **25** ත් අතර කාලයක සිට හිඟව පැවති රු.**36,900** ක් හෙවත්, මුළු හිඟයෙන් සියයට **62** ක් දීර්ඝ කාලීනව හිඟ හිටව පැවතුණි.

**2.2.3** දැන්වීම් පුවරු ගාස්තු.
-----------------------

**1988** අගෝස්තු **23** දිනැති අංක **52/7** දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන ලද **1952** අංක **06** දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා සංග්‍රහයේ අංක **39** වගන්තියේ ප්‍රචාරක දැන්වීම් හා දෘශ්‍ය පරිසරය යන ඡේදයේ **1** වගන්තියට අදාළව සභා බල ප්‍රදේශය තුළ දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා බලපත්‍රයක් ලබා ගත යුතු බව දක්වා ඇතත්, එම නියමයෙන් බැහැරව දැන්වීම් පුවරු වෙනුවෙන් ආයතන **13** කින් රු.**26,700** ක් වූ ගාස්තු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.4** උසාවි දඩ හා මුද්දර ගාස්තු.
---------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් **2016** දෙසැම්බර් **31** දිනට උසාවි දඩ රු.**800,000** ක් හා මුද්දර ගාස්තු රු.**43,575,375** ක් අය වියයුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය.**

**3.1 කාර්යසාධනය.**

**(අ) සභා අරමුදල් යටතේ සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීම.**

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සභා අරමුදල් යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ සංවර්ධන යෝජනා 52 ක් පළාත් පාලන කොමසාරිස්වරයා වෙත වර්ෂය ආරම්භ වී මාස 6 ක් ගත වීමෙන් පසුව 2016 ජුනි 16 දින ඉදිරිපත් කර තිබූ යෝජනා 43 ක් 2016 අගෝස්තු 30 සිට 2016 දෙසැම්බර් 29 දක්වා කාලය තුළ අවස්ථා 7 කදී ප්‍රධාන අමාත්‍යවරයා අනුමත කර එවා තිබුණි. එම යෝජනා අතරින් යෝජනා 7 ක් පමණක් ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කිරීම සඳහා කොන්ත්‍රාත් සමිති සමග 2016 දෙසැම්බර් 30 දින ගිවිසුම්ගත වී 2017 වර්ෂයේ දි ක්‍රියාත්මක කිරීමට කටයුතු කර තිබූ අතර, සංවර්ධන යෝජනා 36 ක් ඉටු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) සභාව විසින් එක් එක් වර්ෂයන්ට අදාළ ස්වයං උත්පාදන ආදායමෙන් සියයට 30 කට වැඩි ප්‍රතිශතයක් පනතේ අරමුණු ඉටු වන ආකාරයෙන් සංවර්ධන කාර්යයන් සඳහා යෙදවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු.87,347,396 ක පුනරාවර්තන ආදායමක් උපයා ගෙන තිබියදී, ඉන් සංවර්ධන කටයුතු සඳහා කිසිදු මුදලක් යෙදවීමට කටයුතු නොකර, රු.20,000,000 ක මුදලක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.

**(ආ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.**

ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ 2016 ජුලි 28 දින හා 2016 ඔක්තෝබර් 17 දිනයන්හිදි රු.3,550,000 ක් වටිනා ව්‍යාපෘති 4 ක් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් අනුමත කර එවා තිබුණි. මින් ව්‍යාපෘති 3 ක් සමාලෝචිත වර්ෂය තුළ ක්රියාත්මක කිරීමට කටයුතු කර නොතිබූ බැවින්, ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහනේ අරමුණු ප්‍රමාණවත් ලෙස ඉටු කර ගත නොහැකි වී තිබුණි.

**(ඇ) පොදු වැසිකිළි නඩත්තු නොකිරීම.**

පොත්තපිටිය, දන්තුරේ හා පේරාදෙණිය නගරයන් හි පිහිටි පොදු වැසිකිළි 3 ක් වර්ෂ ගණනාවක සිට නිසි පරිදි නඩත්තු නොකර සෞඛ්‍යයට අහිතකර අයුරින් පවත්වා ගෙන යමින් පැවතුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා.**

**පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.**

**(අ) අංක 49 – 7613 දරන ට්‍රැක්ටරය අනතුරට පත් වීම.**

**2011 වර්ෂයේ දී අංක 49 – 7613 දරන ට්‍රැක්ටරය සහ ට්‍රේලරයට අනතුරක් සිදු වූ පසුව කිසිදු අලුත්වැඩියාවක් නොකර ස්වාභාවික ආපදාවන්ට ලක් වෙමින් විනාශ වීමට ඉඩ හැර තිබුණු අතර, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් 2014 සැප්තැම්බර් 05 දින රු.700,000 ක රක්ෂණ අලාභ ප්‍රතිපූර්ණයක් කිරීමට එකග වී ඇතත්, 2017 මාර්තු 25 දින වන විටත් එම මුදල් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.**

**(ආ) මානව සම්පත් කළමනාකරණය.**

**2016 ඔක්තෝබර් 11 දිනට තනතුරු 3 ක පුරප්පාඩු 3 ක් හා තනතුරු 4 ක අතිරික්තතා 7 ක් පැවතුණි.**

**(ඇ) ආයුර්වේද සායන මධ්‍යස්ථාන.**

**සභාව සතුව ආයුර්වේද සායන මධ්‍යස්ථාන 12 කට අදාළ වෛද්‍ය පහසුකම් සැපයුම් වෙනුවෙන් රු.1,100,000 ක සභා අරමුදල් වෙන් කර ඇතත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට උපයෝජනය කර තිබුණේ ඉන් සියයට 47 ක ප්‍රතිශතයක් වන අතර, ඇඹිල්මීගම ආයුර්වේද මධ්‍යස්ථානයට ප්‍රමාණවත් ඖෂධ සපයා නොමැති බවක් අනාවරණය විය.**

**(ඇ) පොදු තැන්පතු.**

**(i) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විවිධ තැන්පතු යටතේ රු.7,550,424 ක ශේෂයක් පැවති අතර, 2014 වර්ෂයේ දී අවස්ථා 14 කදි සහ 2015 වර්ෂයේ දී අවස්ථා 42 කදී තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබු ඉදි කිරීම් කොන්ත්‍රාත් සඳහා වූ අත රැදවුම් මුදල් පිළිවෙළින් රු.2,281,375 ක් හා රු.796,658 ක් ගිවිසුම්ගත කාලය අවසන් වීමෙන් පසු අදාල කොන්ත්‍රාත්කරුට ගෙවීමට හෝ නඩත්තු කළ යුතු කර්මාන්ත ඇත්නම්, ඒ සඳහා යෙදවීමට හෝ කටයුතු කිරිමෙන් තොරව තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.**

(ii) ඉකුත් වර්ෂය තුළ දී කසළ බැහැර කිරීම, මැතිවරණ දීමනා, සේවක ඇප, ආපදා ණය අය කිරීම් හා විනෝද බදු යනාදි විෂයයන් යටතේ අවස්ථා 10 කදි ලැබී තිබූ රු.104,698 ක මුදලක් නිරවුල් කිරීමට කටයුතු කිරීමකින් තොරව විවිධ තැන්පතු යටතේ රදවා ගෙන තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ දි ඉඩම් අනු බෙදුම් කටයුතුවල දී පොදු කටයුතු සඳහා සභාවට වෙන් කළ ඉඩම් කොටස වෙනුවෙන් අවස්ථා 3 කදී සභාවට ලැබී තිබූ රු.1,489,101 ක මුදලක් ඉඩම්වල පොදු කටයුතු සඳහා යෙදවීමට කටයුතු කිරීමකින් තොරව තැන්පතු ගිණුමේ රදවා ගෙන තිබුණි.

(ඉ) ඉඩම්වල අයිතිය පවරා ගැනීම.

---

(i) ඉඩම් කට්ටි කර විකිණීමේ දී අදාළ ඉඩම්වලින් සභාවට හිමි ඉඩම්වල ඔප්පු ප්‍රාදේශීය සභාව නමට පවරා ගත යුතු වුවත්, 2015 වර්ෂයේ රු.375,000 ක් වටිනා පර්චස් ප්‍රමාණය 71 කින් සමන්විත ඔප්පු 3 ක් සභාවේ සභාපති/ ලේකම් යනුවෙන් නිල නාමයට ලියා තිබුණි.

(ii) සුසාන භූමි 7 ක අයිතිය පවරා ගෙන නොතිබූ අතර, සුසාන භූමි 35 ක වැට මායිම් සකස් කර ආරක්ෂාව තහවුරු කර නොතිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා.

---

අනිවාර්ය විශ්‍රාම යැවූ නිලධාරියෙකුගෙන් හා වැඩ තහනම් කළ නිලධාරියෙකුගෙන් අය විය යුතු රු.261,369 ක සේවක ණය ශේෂයක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.4 සන අපද්‍රව්‍ය කළමනාකරණය.

---

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) ප්‍රාදේශීය සභාව විසින් නිෂ්පාදනය කරනු ලබන කාබනික පොහොර කසළ හලන යන්ත්‍රයක් මගින් හැලීමක් සිදු නොකරන බැවින්, නිසි ප්‍රමිතියෙන් යුතු කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීමේ හැකියාව සීමා වී තිබුණි. ඒ අනුව, දැනට නිෂ්පාදිත කාබනික පොහොර ටොන් 300 ක් පමණ නිෂ්ප්‍රයෝජනව කිරිමැටියාව කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ එළිමහනේ ස්වාභාවික ආපදාවන්ට ලක් වෙමින් පැවතුණි.

(ආ) කසළ ව්‍යාපෘතිය වෙනුවෙන් 2016 ඔක්තෝබර් 07 දින වන විට රු.99,900 ක මැසි නාශක බෙහෙත් යොදා තිබුණත්, ස්ථානීය පරීක්ෂාවේ දී අධික මැසි ගහණයක් නිරීක්ෂණය විය.

(ඇ) පේරාදෙණිය සිට ගන්නෝරුව දක්වා මාර්ගයට සමාන්තරව ගලා බසින මහවැලි ගගේ ගං ඉවුරට හා ඊට යාබද රක්ෂිතයට නිවාස හා ව්‍යාපාරික ස්ථානවලින් කසළ සහ අප ජලය බැහැර කරන බවක් 2016 ඔක්තෝබර් 07 දින කරන ලද ස්ථානීය පරීක්ෂාවේ දී අනාවරණය විය.

**4.** ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

------------------------------------

**4.1** අයවැය පාලනය.

------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය තුළ දී ආදායම් හා වියදම් විෂයයන් අතර ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුව ද අයවැයගත හා තථ්‍ය, ආදායම් විෂයයන් 25 ක සියයට 13 සිට සියයට 99 ක් දක්වා ද, වියදම් විෂයයන් 43 ක සියයට 12 සිට සියයට 97 දක්වා ද සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) වැය විෂයයන් 24 ක් සඳහා සලසා දි තිබුණු රු.6,737,000 ක සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

(ඇ) ආදායම් විෂයයන් 8 ක රු.963,600 ක් වූ ඇස්තමේන්තු ප්‍රතිපාදනවලින් ආදායමක් උපයා ගෙන නොතිබුණි.

(ඈ) ඉදිරි වර්ෂයේ දී ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිත සංවර්ධන කටයුතු සඳහා පූර්ව වර්ෂයේ දී සංවර්ධන යෝජනා ලබා ගෙන ප්‍රමුඛතාවය සකස් කර ඉදිරි වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ව්‍යාපෘතීන් සඳහා විධිමත් පරිදි ඇස්තමේන්තු ලබා ගෙන එකී ඇස්තමේන්තුගත වටිනාකම අනුව අයවැය ඇස්තමේන්තු පිළියෙළ කළ යුතු වුවත්, එසේ කිරීමකින් තොරව රු.20,000,000 ක දළ අගයක් යොදා සහා අරමුදල් සඳහා වූ ප්‍රාග්ධන වැය ඇස්තමේන්තු පිළියෙළ කර සම්මත කර ගෙන තිබුණි.

**4.2 වත්කම් කළමනාකරණය.**

**----------------------------**

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.**

**-----------------------------------------**

**සභාව සතු ට්‍රැක්ටරයක් වර්ෂ 7 ක කාලයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි.**

**4.3 සංයුක්ත සැළැස්ම.**

**--------------------**

**සමාලෝචිත වර්ෂය ආවරණය වන පරිදි සංයුක්ත සැළැස්මක් පිළියෙළ කර නොතිබුණි.**

**4.4 ක්‍රියාකාරී සැළැස්ම.**

**--------------------**

**සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැළැස්මක් සකස් කර නොතිබුණි.**

**5. පද්ධති හා පාලනය.**

**---------------------**

**පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.**

**(අ)** කොන්ත්‍රාත් පරිපාලනය

**(ආ)** ආදායම් පරිපාලනය

**(ඇ)** වත්කම් කළමනාකරණය

**(ඇ)** ණයගැතියන් හා ණයහිමියෝ